# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 40 දරන රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 සැප්තැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 40 දරන රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 28 වන දින ]

එල්. ඩී.—ඕ. අයි. එන්. සී. 37/2005

### රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම" යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් එකී පදනමේ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියළු කාරණා සහ අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටුකර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත 2007 අංක 40 දරන රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනමේ දැනට සාමාජිකයන් වූ සියළු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුලත් කරනු ලබන සාමාජිකයෝ ද මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු "රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන, එය පාවිච්චි කිරීමේ ද, සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියළු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීමද කළ හැකිය. රත්නපුර, මාරපන ශාස්ත්‍රෝදය පදනම සංස්ථාගත කිරීම.

2-P L 002226- 2,800 (2007/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අධ්‍යාපන පහසුකම් අඩු සහ නොමැති ප්‍රදේශවල ළමුන් සහ වැඩිහිටියන් සඳහා පෙර පාසල් සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ආ) මිනිසුන් අතර සාමය හා සහජීවනය වැඩිදියුණු කිරීම ;

(ඇ) ශ්‍රී ලාංකික සමාජය තුළ විද්‍යාත්මක සහ සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම ;

(ඈ) සමාන අරමුණු දරන වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඉ) ස්වයං රැකියාවල නිරතවීම සඳහා තරුණයන්ට මුදල්මය වශයෙන් සහ වෙනත් ආකාරයෙන් සහාය දීම;

(ඊ) ක්‍රීඩා කටයුතුවල පුහුණුව සඳහා තරුණයන්ට පහසුකම් සළසා දීම ;

(උ) තරුණයන් සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, විවාද හා සමාන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ;

(ඌ) ජනතාව අතර දැනුම දියුණු කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැපයීම සහ පොත් පත් එකතු කිරීම හා බෙදා හැරීම;

(එ) තරුණයන්ගේ සහජ කුසලතා හා දක්ෂතා දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් හා දිරි ගැන්වීම් සැපයීම ; සහ

(ඒ) සරණාගත සහ අවතැන් වූ පුද්ගලයන් සුභසාධනය, ආරක්ෂාව සඳහා මධ්‍යස්ථාන පිහිටුවා නඩත්තු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ

ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශය හෝ යෝග්‍ය වූ ද සියලු ක්‍රියා කිරීමේ හා ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) 6 වන වගන්තිය යටතේ සැකසෙන, සංස්ථාවේ රීතිවලට අනුකූලව සහ මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පහත සඳහන් නිලධාරීගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුව විසින් කළමනාකරණය කරනු ලැබිය යුත්තේ ය :—

(අ) සභාපති, උප සභාපති, ලේකම්, සහකාර ලේකම් සහ භාණ්ඩාගාරිකවරයකුගෙන් සමන්විත විධායක කමිටුව ;

(ආ) සාමාජිකයන් දහතුන් දෙනකුගෙන් යුතු කාරක සභාව ; සහ

(ඇ) මෙහි (අ) ඡේදයේ සඳහන් විධායක කමිටුව විසින් පත් කරනු ලබන මනා දැනුමක් ඇති පුද්ගලයන් තිදෙනකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලය.

(2) සංස්ථාවේ ප්‍රථම ක්‍රියාකාරී කමිටුව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

රීති සෑදීමේ බලය.

**6**. සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද නිලධාරී මණ්ඩල, ක්‍රියාකාරී කමිටුව පත්කර ගැනීමේ සහ ඉවත් කිරීම සඳහා ද, සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්යය හා කර්තව්‍ය සම්බන්ධයෙන් ද, සංස්ථාවේ පරමාර්ථ එකක් හෝ ඊට වැඩි ගණනක් ඉටුකිරීම පිණිස සංස්ථාවට අනුයාත මණ්ඩල පිහිටුවීම සඳහා සහ එම මණ්ඩලවල බලතල හා කාර්ය තීරණය කිරීම සඳහා ද මේ හැර සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි, මහා සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට අඩු නොවන බහුතර ඡන්දයෙන් රීති සෑදීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ අරමුදල.

**7**. (1) සංස්ථාවට සංස්ථාවේ ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන් ලැබෙන ත්‍යාග, රික්තවරණ පැවරීම්, හුවමාරු, පරිත්‍යාග හෝ දායක මුදල් ක්‍රියාකාරී කමිටුව තීරණය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නමට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පදනමෙන් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය.

**8**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, පදනමට ගෙවිය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9**. (1) ක්‍රියාකාරී කමිටුව විසින් සංස්ථාවේ සියලු ලැබීම් සහ වියදම් සම්බන්ධයෙන් විධිමත් ගිණුම් පොත් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කිරීම සහ විගණනය යටත් පිරිසෙන් වසරකට වරක්වත් කල යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුම්වල සහ ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10**. සභාපති හෝ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා සහ ක්‍රියාකාරී කමිටුවේ වෙනත් යම් සාමාජිකයකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල, දේපළක් භාර ගැනීමටත්, දැරීමටත්, නීතියෙහි ලා හැකියාව සහ ශක්‍යතාව සංස්ථාවට ඇත්තේ ය. තව ද එම දේපළ, විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර

සංස්ථාවේ

ගැනීමේ හා අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, භාර ගැනීමේ සහ දැරීමේ හැකියාව සහ බලය, නීතියෙන් සංස්ථාවට ඇත්තේ ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**12**. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර, බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14**. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.